


# පාසැල් බසයෙන් බැස චමින්දලා ගෙදරට

එහෙත් චමින්ද රාජපක්ෂ තවමත් මගේ බලවත් සගයෙක් නොවීය. සියල්ල වෙනස් වූ දවස උදා විය. සමන් පන්තියේ සිටි සිරිමල්වත්තෙන්ම බසයෙන් බැසයන මම වැඩිය කතා නොකළ "මචන්" එදා 318 බස් එකෙන් බැස්ස ගමන්ම අමුතු වැඩක් කළේය.

ඔහුගේ පොත් බැගය පිටේ එල්ලගෙන ඉන්න අතරම මගේ පොඩි සුට්කේසයද අතට ගත් ඔහු අද අපේ ගෙදර යමන් කියමින් එක පිම්මට තේවත්ත මැදින් දිව යන්නට විය. දැන් මට කල හැක්කේ එකම දෙයකි ඒ ඔහු පසු පස හඹා ගොස් මගේ සුට්කේසය නැවත උදුරා ගැනීමයි.

මම සටනට අවතීර්ණ වුයෙමි. දැන් අපි දෙන්නම තේ වත්ත මැදින් කන්ද හෙලේ හැල්මේ දුවයමින් සිටිමු. චමින්ද අල්ලනවා තියා හිතන්නට වත් බැරි තැනක සිට මාව ඒ දෙසට කැඳවයි. මම ටිකක් කිට්ටු කරන කොට නැවතත් දුවයි.

අවසානයේ කන්ද මුදුනටම ගිය ඔහු තෙවත්තේ කෙලවරින් පටන් ගන්නා ගුරු පාරක් දිගේ දිවයයි. ඒ පාරේ කෙලවර ගෙයක් පෙනේ. මට සුට් කේස් එක කෙසේ වෙතත් දැන් නම් හොඳ ගනන්ය. නිවසේ මිදුලට ගිය ඔහු මට පාසැල් බැගය දීමට පෙර මාව ඔහුගේ මවට හඳුන්වා දුන්නේ අම්මා මේ මගේ යාලුවෙක් එක්කන් ආවා කියමිනි. අම්මා මගේ ඔලුව අතගා මේ අර සිරිනාවති අක්කල විමලා අක්කගේ පුතා නේදැයි මාව හඳුනා ගත්තේය.

මට චමින්දලා අම්මා කියන එක වචනයක් වත් නැසුණු ගානය. ඊට හේතුව ඔවුන්ගේ ගේ වටේටම රතු පාටින් බැබලෙමින් තිබු ගස් තොගයයි. මගේ සිතඟි තේරුම් ගත් මැදපුරණෝ ලොකුනැන්දා " පුතා පේර ගෙඩියක් දෙකක් එහෙම කාලා එන්නකෝ බත් ටිකක් කන්න " යැයි මට කීවාය. "මේ පුතාට පේර ගෙඩි දෙකක් කඩලා දීපන් ලොකුපුතා" කියමින් චමින්දවද ජෑම් පේර ගොල්ලට පිටමන් කාලාය.

මට ගෙදර යාමක් ගැන වගේ වගක් සිහියට නොනැගේ. කළුවර වී ගෙන එන විට මැදපුරණෝ නැන්දා මට ගෙදර යන එක මතක් කර දුන්නාය. ඒ වන විට මම දහවල් ආහාරය චමින්දල ගෙදරින්ම ගෙන නැවතත් ජෑම් පේර ගොල්ලට ඔට්ටුවී සිටියෙමි. " විමලා අක්කා කලබලවෙයි පුතා" කියමින් ඇය මා උනන්දු කලාය.

එකල අපේ ගමට දුරකතනයක් තබා නවීන සංනිවේදන ක්‍රම කිසිවක් තිබුනේ නැත. තිබුනානම් ඇය මාව එදින ඔවුන්ගේ නිවසේ රඳවා ගනු ඇත. "පණිවිඩයක් වත් යවන්න කෙනෙක් නෑ නේ" කීවේ ඒනිසා විය යුතුය.

චමින්දලාට වත් අපටවත් එකල විදුලිය තිබුණේ නැත. එහෙත් 1985-86 කාලයේදී චමින්දලාගේ ගෙවල් තිබෙන කිරඹඹය කොටසට විදුලිය ලැබුණි. එහෙත් 1977 පාලනයට පැමිණි රජය ලයිට් කණු ඇද තිබුනේ අමුතු රටාවකටය.

අපේ මුත්තලා ගෙවල් ලගිනුත් , චමින්දලා ගෙවල් ලගිනුත් විදුලි කණු වැටී තිබුනද අපේ ගෙවල් අහල මායිමකින්වත් ඒවා ගොස් තිබුනේ නැත. වෙනත් විදියකින් කියතොත්, විදුලි කණු ඇද තිබුනේ UNP නිවාස ආවරණය වී ශ්‍රී ලංකා කාරයන්ගේ නිවාස (අපේ තාත්තා වගේ අයගේ) මග හැරවෙන විදිහටයි.

දේශපාලනය පැත්තකින් තියා අපේ කතාවේ ඉතිරි කොටසට යාමට ඔබ මට බල කරයි. එහෙත් ඉතිරි කොටස දේශපාලනය කොතරම් අපේ සම්බන්දතා වලට කාවැදී තිබුනාදැයි යන්නට කදිම සාක්ෂියකි.

## වේදනාත්මක සමුගැනීම

මම අවසානයේ චමින්දටත් , චමින්දලා අම්මාටත් සමුදී අපේ ගෙදර බලා පිටත් වුනෙමි. අම්මලා පැත්තෙන් අපේ ලගම නෑදෑ ගෙදරක් වුවත් එහි සිට අපේ ගෙදරට යන පාරට හැරෙන තැනට යන්නට මාදෑන සිටියේ නැත. චමින්ද ‍ඹබකදව වත්ත ලගට මාව ගෙනත් ඇරලවා ගෙදර ගියේය.

දැන් වටින් ගොඩින් කළුවර වීගෙන එයි. මට ගමනේ සන්තෝෂය මිසක් කිසිම බරක් පතලක් ඇති බවක් ගෙදරට ළඟා වෙන තුරුම වැටහුනේ නැත. මම වීරයා සේ "අම්මා දන්නවද වැඩක්... අද මට අම්මලාගේ ලගම නෑදෑ කට්ටියක් හම්බ වුනා" කියමින් ගෙට ගොඩ වුයෙමි.

ගමනේ විස්තරත් චමින්දලා අම්මාගේ සැලකිලිත් අකුරක් නෑර පැවසුයෙමි. මට දෙවියන් සිහි වුයේ අම්මාගේ උත්තරයත් සමගිනි. "තෝ කොහෙද ගියේ.. අපේ ජන්ම හතුරන්ගේ ගෙවල් වල ගිහිල්ලා ... තොගේ තාත්තාට බිම දාගෙන ගහපු එවුන්ගේ නෑදෑයින්ගේ ගෙවල් වල ගිහින් කන්න බොන්න තොට බය නැද්ද?" අසමින් අම්මා මට තඩි බායි ..ඉන් නොනැවතී ...."උඹට වස දාල දුන්න නම්" කියමින් අම්මා මට තවත් අත දිගහැර පහර දුන්නාය.

අවුරුදු 10 කා කොල්ලෙක් හැටියට මට මේ කිසිවක "පරිවර්තනයක්" එදා නොතේරුනාට ශ්‍රී ලංකා UNP කතාව සම්බන්ධ වන්නේ මෙතනදී බව මට දැන් හොඳින් වැටහේ. ඒ 1977 UNP ජයග්‍රහනයෙන් පසු අපේ තාත්තාට Dunlop වත්ත ලගදී හොඳටම පහරදී බිම දම පාගා යෑමට සැලසුම් සකස් කල අංක එකේ සැලසුම්කරු වුයේ චමින්ද ගේ බාප්පා කෙනෙක් වීමයි.

පසු කලක විශ්ව විද්‍යාරලයට ගොස් දොස්තර කෙනෙකු වූ එම බප්පාකගේම පුතාට අ. පො. ස. (සා පෙ) ගණිතය සහ විද්‍යාව.. මුදලට වුවද... ඉතා උවමනාවෙන් ඉගැන්වූ ගුරුවරයා වුයේ මා බව සදහන් කරන්නේ සියුම් සතුටකින් යුතුවයි.

**Be happy for this moment. This moment is your life.**
Omar Khayyam

# සුබී දීඝායුබො බව!

### රත්න ශ්‍රී විජේසිංහ



ඕස්ට්‍රේලියාවේ වියළි සුළඟට
සිල් සුවඳ දම් සුවඳ මුසු කළ
නාඹටුන්නේ විජිත යතිවර
නා සමිඳු යුග පාද පංකජ

දුරු රටක නුපුරුදු දනන් මැද
මහ වෙහෙර - 'දම් සරණ' ඉදිකොට
සසර ගොරතර බව්නි අසරණ
බොදු දනන් සිත් නිවා සනහන

පුරා විසිවස් පිරූ පෙරුමින
සදා දුරු රට බොදු සසුන් පත
නිවා සනහා දනන් සිත ගත
මහා මෙහෙවර දිනූ හිමි සඳ

සපිරි සැටවස් ජන්ම දිනයද
නිබඳ බහුජන සෙත පිණිසමය
එපින මහිමිට, ආයු, වණ, බල,
සැප ද නැණ ගුණ සඳනු පිණිසය

නිවන් දොර වෙත නැඟෙන පා යුග
දනන් සමග ම නගන හිමිසඳ
එකත් පස්වෙමි පා පියුම් වැඳ
සුපිළිපන් නා සම්මිඳු අබියස

*වෙසක් මාසයේ යෙදුණු, කීස්බොරෝ හි ධම්ම සරණ විහාරයේ විහාරාධිපති නාඹටුන්නේ විජිත හිමියන්ගේ 60 වන ජන්ම දිනය නිමිත්තෙනි.*

# වසන්තය

### ආශා ඩී පෙරේරා

වසන්තය තව බොහෝ දුර උන
ළපටි තුරුපත් පවා මැළ උන
දරන්නට බැරි කිසි දෙයක් නැති
මහා පොළොවත් බොහෝ රළු උනු
අහස ගිනි ගෙන හිරුද හළු උන
සඳ නිවී ලොව ඝන අඳුරු උන
මෙවන් දවසක බොහෝ දුක් විද.
තැනිතලා කඳු ශිඛර පසුකර
හද දෙවොළ කරුණා කරන්නට
අවාරේ ආ බැතිමතා නුඹ






# ක්ලැසිෆයිඩ් කවියක්

ඒ ලුහුඬු දැන්වීම
කපා වෙන්කොට
තබා මේසය මත
පත්තරය ගෙන නික්මෙමි

පේමන්ට්ටෙකේ නැවතී
නැවත
නැවතත්
විමසමි
හිස් තැන
තිබුණු තැන

අඩු ලුහුඬුකම් නැති
ලුහුඬු දැන්වීමක
උපරිම වචන කීයද?
වචනෙට තවම සීයද?

ඔබට ගේ වික්කැකි
මට අතීතය රැක්කැකි

මංජුල වෙඩිවර්ධන

('නිදි නැති නිර්මල ඇසක අගිස්සක කඳුළක්' -2014)

**'අසෙනිය කුසුම' තීරුව දිග හැරෙන්නේ අපේ හිත ගත් කවියක විඳුම් විඳවුම් කෙබඳුද යන්න සහෘද ඔබත් සමඟ බෙදා හදා ගන්නටය. මෙය තවත් එක කාව්‍ය විචාරයක් නොවන අතර තොරාගනු ලබන කවියක් හොඳද නරකදැයි නිගමන නොදී, මිණුම් දඬු හා විචාරක්ෂීන් ගලවා තබා කවිය තුළම ගිලී කිමිදී රස උල්පත් පාදා ගන්නයි මේ කුඩා වෑයම.**

මංජුල වෙඩිවර්ධනගේ නවතම කාව්‍ය සංග්‍රහයේ අන්තර්ගත 'ක්ලැසිෆයිඩ් කවියක්' නම් කවියයි අද තෝරා ගත්තේ. 'ක්ලැසිෆයිඩ්' යන නම ඇසූ සැනි න්ම අප මතකයට එන්නේ